යා අල්ලාහ් මට සමාව දෙනු මැනව, මට කරුණා කරනු මැනව, උත්තරීතර මිතුරා සමඟ මා ද සේන්දු කරනු මැනව.

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා තමන් වෙත හාන්සි වී සිටිය දී කළ ප්රකාශයකට
තමන් සවන් දුන් බව ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. ((යා අල්ලාහ් මට සමාව දෙනු මැනව, මට කරුණා කරනු මැනව, උත්තරීතර මිතුරා සමඟ මා ද සේන්දු
කරනු මැනව.))
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගේ අවසන් මොහොත ළඟා වූ කල්හි විශ්වාසවන්තයින්ගේ මව් වූ ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය වෙත හාන්සි වෙමින් උත්තරීතර මිතුරා සමග තමන්වද එක් කරන මෙන් තම පරමාධිපතිගෙන් අයැද සිටියහ. ඔවුන් වනාහි නබිවරු (දෙවි දූතයෝ) සිද්දීකීන්වරු (සත්යවාදීහු) ෂුහදාවරු (දිවි පිදූවෝ) සාලිහීන්වරු (දැහැමියෝ) වෙති.

http://www.sunnah.global/hadeeth/si/show/5472